# 5 වන දවස

## ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි

**අබ්බා තාත්තා අපත් සමඟ නිරන්තරයෙන් ම වැඩ සිටින දෙවි කෙනෙකි.**

**''............ මම කිසිසේත් ඔබගෙන් අහක්ව නොයමි; කිසි අයුරකින් නුඹ අත් නොහරින්නෙමි'' යි දෙවියන් වහන්සේ ම වදාරා තිබේ''** (හෙබ්‍රෙව් 13:5). අපගේ ආදර දේව තාත්තා නිරතුරුව ම අප සමඟ සිටිති. ඔවුන් වහන්සේ මාගේ සරණය වනසේක. එමනිසා මම බිය නොවෙමි. මුළු විශ්වයම මවා වදාළ එය පාලනය කරන දෙවි මහෝත්තමයාණෝ නිරතුරුව ම මා සමඟ නම්, මම ඔවුන් වහන්සේගේ පුතා බව පිළිගන්නවා නම් මා කිසිම දෙයකට බිය විය යුතු නැත. මා ප්‍රශ්නවල හිරවී සිටින විට ද අසනීපයක් නිසා වේදනා විඳින විට ද අග හිඟකම්වලට මුහුණ දෙන විට ද පියාණන් වහන්සේ මා සමඟ බව පිළිගන්නට ශුද්ධාත්ම බලය පතමු. යෙසායා 43:2 **''නුඹලා ගැඹුරු ජලය මැදින් යනවිට මම නුඹලා සමඟ සිටින්නෙමි''** යෙසායා 43:5 **''බිය නොවන්න මා නුඹලා සමඟ සිටිමි''** මේ වදන් මාගේ ආහාරය කර ගනිමි.

**දවස පුරා :-**
- ✵ දෙවියන් වහන්සේ මා සමඟ ය යන සත්‍යතාවයට දවස පුරා අවදි වෙමු.
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 102